# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2312/41 - 2022 දෙසැම්බර් මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ නියමයන්ට අනුකූලව පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1941/41 හා 2015.11.20 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* පළ කරනු ලැබ ඇති උපලේඛනයෙහි 1 කොටසෙහි, අංක 21 සහ 22 යටතේ නව විධිවිධාන ඇතුළත් කරමින් එම උපලේඛනයේ 1 කොටස 2022.12.23 දින සිට බලපවත්වන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

02.

| *1 තීරුව*<br>නිලධාරී ගණය | *11 තීරුව*<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | *111 තීරුව*<br>පවරන ලද බලතල |
|---|---|---|
| 21. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ,<br><br>(අ) දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන හා අමාත්‍යාංශයක් යටතේ නොවන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 218 සිට 222 දක්වා අතර විධිවිධාන අනුව ස්ථාන මාරු කිරීම<br><br>(II) ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය |
| (ආ) අමාත්‍යාංශය යටතේ නොවන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතියික මට්ටමේ අධි ශ්‍රේණියේ / විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් / අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුව දිස්ත්‍රික්ක අතර ස්ථාන මාරු කිරීම<br><br>(II)රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 223 හි දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාන මාරු කිරීම |

| *1 තීරුව*<br>නිලධාරී ගණය | *11 තීරුව*<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | *111 තීරුව*<br>පවරන ලද බලතල |
|---|---|---|
| 22. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ,<br><br>(අ) ඒකාබද්ධ සේවාවන්ට අයත් නොවන, අංක 06/2006 දරන, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ, ද්විතියික මට්ටමේ නිලධරයන් සහ තෘතියික මට්ටමේ අධි ශ්‍රේණියේ / විශේෂ ශ්‍රේණියේ නොවන නිලධරයන් | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි/සේවා ව්‍යවස්ථා අනුව පත්කිරීම සහ උසස් කිරීම<br><br>(II) විනය පාලනය හා සේවයෙන් පහ කිරීම |
| | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් / අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 218 සිට 222 දක්වා අතර විධිවිධාන අනුව ස්ථාන මාරු කිරීම |
| | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් /ගොවිජන සංවර්ධන කොමසාරිස් (මානව සම්පත් සංවර්ධන) | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුව දිස්ත්‍රික්ක අතර ස්ථාන මාරු කිරීම<br><br>(II) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 223 හි දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාන මාරු කිරීම |
| | අදාළ පරිපාලන දිස්ත්‍රික්කය භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුව දිස්ත්‍රික්ක තුළ පිහිටි ප්‍රාදේශීය කාර්යාල අතර ස්ථාන මාරු කිරීම |

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1941/41 හා 2015.11.20 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2022 දෙසැම්බර් මස 23 වැනි දින,
අංක 1200/9,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

EOG 12 - 0397/1

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ නියමයන්ට අනුකූලව පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරනු ලැබ ඇති උපලේඛනයෙහි 1 කොටසෙහි, අංක 23 සහ 24 යටතේ නව විධිවිධාන ඇතුළත් කරමින් එම උපලේඛනයේ 1 කොටස 2022.12.23 දින සිට බලපවත්වන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

02.

| *1 තීරුව*<br>නිලධාරී ගණය | *11 තීරුව*<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | *111 තීරුව*<br>පවරන ලද බලතල |
|---|---|---|
| 23. අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති<br><br>(අ) දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන හා අමාත්‍යාංශයක් යටතේ නොවන, ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන්<br><br>(ආ) තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ / විශේෂ ශ්‍රේණියේ නිලධරයන්<br><br>දරනු ලබන තනතුරුවලට සමාන තනතුරු දරන සමෘද්ධි සංවර්ධන පනතේ 44 (ඉ) IV වගන්තිය යටතේ පත්වීම් ලබා ගැනීම සඳහා මනාපය පළ කළ නිලධරයන් | සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූල ස්ථාන මාරු කිරීම.<br><br>(II) ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |
| 24. අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති<br><br>(අ) අධි ශ්‍රේණියේ / විශේෂ ශ්‍රේණියේ නිලධරයන් නොවන, තෘතීයික මට්ටමේ නිලධරයන්<br><br>(ආ)ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීක මට්ටමේ නිලධරයන්<br><br>දරනු ලබන තනතුරුවලට සමාන තනතුරු දරන සමෘද්ධි සංවර්ධන පනතේ 44 (ඉ) IV වගන්තිය යටතේ පත්වීම් ලබා ගැනීම සඳහා මනාපය පළ කළ නිලධරයන් | සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි සේවා ව්‍යවස්ථා අනුව පත්කිරීම සහ උසස් කිරීම.<br><br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූල ස්ථාන මාරු කිරීම.<br><br>III. විනය පාලනය හා සේවයෙන් පහ කිරීම. |

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1941/41 හා 2015.11.20 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2022 දෙසැම්බර් මස 23 වැනි දින,
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

EOG 12 - 0397/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.